ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

## ළමයා සම්බන්ධ මාධ්‍ය වාර්තාකරණයේදී ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන

# ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය



## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

# පටුන


01 පොදු සදාචාරාත්මක මූලධර්ම

02 අපයෝජන සහ අපචාර වාර්තාකරණය

03 ළමා සියදිවි නසාගැනීම්

04 විවිධ වැඩසටහන් සඳහා ළමුන් යොදාගැනීම

## "ළමයා සම්බන්ධ වාර්තාකරණයේදී ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය" සම්පාදනයේ දී දායක වූ විද්වත් කමිටු සාමාජිකයන්

1. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු ප්‍රීති ඉනෝකා රණසිංහ මැතිනිය
   සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2. මහාචාර්ය ක්ලිෆර්ඩ් පෙරේරා මහතා
   නියෝජ්‍ය සභාපති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

3. අනෝමා සිරිවර්ධන මහත්මිය
   හිටපු අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

4. ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය - විජයානන්ද රූපසිංහ මහතා
   සන්නිවේදන අධ්‍යනාංශය - කැලණිය විශ්ව විද්‍යාලය

5. ආචාර්ය නයනා සුරවීර මහත්මිය - ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය,
   ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්ව විද්‍යාලය

6. මහාචාර්ය පූජිත වික්‍රමසිංහ මහතා - ළමා රෝග අධ්‍යනාංශය,
   වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

7. වෛද්‍ය දර්ශනී හෙට්ටිආරච්චි මහත්මිය - ළමා හා යොවුන් මනස
   පිළිබඳ විශේෂඥ වෛද්‍ය,රිජ්වේ ආර්යා රෝහල

8. ආචාර්ය නිරෝෂණී තඹවිට මහතා - කොමසාරිස්,
   ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

9. මහාචාර්ය මධුභාෂිණී හේවගේ මිය - සන්නිවේදන අධ්‍යනාංශය
   ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

10. චරුක දමුණුපොල මහතා - ජ්‍යෙෂ්ඨ තොරතුරු තාක්ෂණ ඉංජිනේරු -
    ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

11. මහාචාර්ය ඉරෝෂා ලක්ෂ්මන් - සමාජවිද්‍යා අධ්‍යනාංශය
    කොළඹ විශ්ව විද්‍යාලය

12. කැලුම් විජේනායක මහතා - හිටපු අතිරේක ලේකම් සංවර්ධන
    ජනමාධ්‍ය අමාත්‍යාංශය

13. ආචාර්ය හර්ෂ බී අබේකෝන් මහතා
සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

14. නීතිවේදී ශානිකා මලල්ගොඩ මහත්මිය - අධ්‍යක්ෂ
සැලසුම් හා තොරතුරු - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

15. ජ්‍යෙෂ්ඨ නීතිඥ සජීවනී අබේකෝන් මහත්මිය - අධ්‍යක්ෂ
නීතිය බලාත්මක කිරීම් - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

16. ලක්ෂිකා මැණික්බෝව මෙනවිය - සහකාර අධ්‍යක්ෂ
මාධ්‍ය හා තොරතුරු - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

17. ධනුෂ්ක සේනාරත්න මහතා - මාධ්‍ය හා තොරතුරු නිලධාරී
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය



# පූර්විකාව

මහජන අවබෝධය සහ කතිකාව හැඩගැස්වීමේදී මාධ්‍ය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය හඳුනා ගනිමින්, මාධ්‍යවේදීන්, මාධ්‍ය වෘත්තිකයන් සහ ඩිජිටල් වේදිකා සඳහා අන්තර්ගත සකසන්නන් සහ බලපෑම්කරුවන් (Influencers) ළමයා පිළිබඳ වාර්තාකරණයේදී සදාචාරාත්මක මූලධර්ම මාලාවක් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි සාමාජිකයන් අතරින් ළමයා විශේෂ ආරක්ෂාවක් සහ සැලකිල්ලක් ලැබිය යුතුය. එහිදී මහජනතාව දැනුවත් කිරීම පමණක් නොව ළමුන්ගේ අභිමානය, අයිතිවාසිකම් සහ උපරිම යහපත ආරක්ෂා කිරීමට මාධ්‍යයට ප්‍රබල වගකීමක් ඇත. 1989 දී සම්මත කරන ලද එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (United Nations Convention on the Rights of the Child-UNCRC) සහ ළමා ආරක්ෂණ නීති ආරක්ෂා කිරීමට කැපවී සිටින රටක් ලෙස, ළමුන් සම්බන්ධයෙන් සදාචාරාත්මක සහ වගකීම් සහිත මාධ්‍ය වාර්තාකරණයේ වැදගත්කම ශ්‍රී ලංකාව පිළිගනී.

මාධ්‍ය වාර්තාකරණයේදී ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන මෙම ජාතික මාර්ගෝපදේශය ස්ථාපිත කර ඇත්තේ සියලුම ආකාරයේ මුද්‍රිත, විද්‍යුත් සහ ඩිජිටල් මාධ්‍යයෙන් පළ කරන වන කරුණු මගින් ළමයාට කායික, මානසික, සමාජීය සහ අධ්‍යාත්මික වශයෙන් සෘජුව හෝ වක්‍රව ඇති වන සෘණාත්මක බලපෑමෙන් ආරක්ෂා කර, සදාචාරාත්මක මූලධර්මවලට අනුගත වන බව සහතික කිරීම සඳහාය. මෙම මූලධර්ම සැලසුම් කර ඇත්තේ ළමයා කවර ආකාරයේ වුව නියෝජනයකදී ගෞරවය, පෞද්ගලිකත්වය, නිරවද්‍යතාව සහ කවර තත්ත්වයන්හිදී වුව ළමයාගේ උපරිම යහපත තහවුරු කිරීම උදෙසාය. මෙම මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන්, මාධ්‍යවේදීන්ට ළමා සුභසාධනයට ධනාත්මක ලෙස දායක වීමට හැකි අතර, ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටීමට ද හැකිය. ළමයාගේ පෞද්ගලිකත්වයට හානියක් නොවන පරිදි ඔවුන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්මට ප්‍රමුඛත්වය ලබා දෙන බව සහතික කිරීමෙන් ළමයාට ආරක්ෂිත පරිසරයක් පෝෂණය කළ හැකිය.

මෙම ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය සියලුම මාධ්‍ය වෘත්තිකයන්, ආයතන, ඩිජිටල් වේදිකා සඳහා අන්තර්ගත සකසන්නන් සහ බලපෑම්කරුවන් සඳහා මාර්ගෝපදේශ රාමුවක් ලෙස ක්‍රියා කරයි. එය වඩාත් දැනුවත්, ළමා හිතකාමී මාධ්‍ය භාවිතයකට දායක වන අතරම, ළමයා පිළිබඳ වාර්තා කිරීමේදී ඉහළම සදාචාරාත්මක ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට දිරිමත් කරයි.

# 01 - පොදු සදාචාරාත්මක මූලධර්ම

**මාධ්‍ය නියෝජනයේදී ළමයාගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා සදාචාරාත්මක මාධ්‍ය කලාව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.**

## 1.1 ළමයාගේ උපරිම යහපත

**(අ) මාධ්‍ය ආශ්‍රිත ඕනෑම ක්‍රියාකාරකමකදී ළමයාගේ උපරිම යහපත මූලික වශයෙන් ආරක්ෂා කළ යුතුය.**

**(ආ) මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී ළමයාට වඩාත් සුදුසු දේට ප්‍රමුඛත්වය දිය යුතුය.**

**(ඇ) ළමයාගේ මානසික සෞඛ්‍යය, ආරක්ෂාව සහ සමස්ත සංවර්ධනය කෙරෙහි මාධ්‍ය නිරාවරණයේ සමස්ත බලපෑම සලකා බැලීමට ක්‍රියා කළ යුතුය.**

## 1.2 සත්‍යය, නිරවද්‍යතාව සහ සාධාරණත්වය

**(අ) සත්‍ය, නිවැරදි සහ සමබර තොරතුරු වාර්තා කිරීමට මාධ්‍ය ආයතනවලට සදාචාරාත්මක බැඳීමක් ඇත. ළමයා පිළිබඳ අන්තර්ගතය ප්‍රකාශයට පත් කිරීමට පෙර සියලු කරුණු සහ මූලාශ්‍ර සත්‍යාපනය** (Verification) **කළ යුතුය.**

**(ආ) වාර්තාකරණයේදී ළමයා සම්බන්ධ සිදුවීම් වැරදි අර්ථ නිරූපණය කිරීම හෝ සංවේදීකරණයට** (Sensation) **ලක් නොකළ යුතුය.**

**(ඇ) ළමයා සම්බන්ධ ඕනෑම තත්ත්වයක් වාර්තා කිරීමට අවශ්‍ය විටදී, ළමයා, පවුල, පාසල සහ ළමයා හා සම්බන්ධ සියලු සමාජ සංස්ථා අගතියට පත් නොවීමට අත්‍යවශයෙන්ම කටයුතු කළ යුතුය.**

**(ඈ) වාර්තාකරණයේදී කෘත්‍රිම බුද්ධිය** (Artificial Intelligence - AI) **යොදා ගනිමින් සකසන ලද අන්තර්ගතයේ නිරවද්‍යතාව සහ සාධාරණත්වය සත්‍යාපනය කර ඇති බව සහතික විය යුතුය. එසේ යොදා ගන්නේ නම්, කෘත්‍රිම බුද්ධිය යොදාගෙන ඇති බවට පැහැදිලිව සඳහන් කළ යුතුය. එහිදී භාවිත කරන ලද ස්වයංක්‍රීය වාර්තාකරණ මෙවලම්** (Automated reporting tools) **සදාචාරාත්මක ප්‍රමිතීන්ට හානි නොකරන බවත් ළමයා පිළිබඳ වැරදි අවබෝධයක් ඇති වන ලෙස නිරූපණය නොකරන බවත් සහතික කළ යුතුය.**

## 1.3 අභිමානයට සහ පෞද්ගලිකත්වයට ගරු කිරීම

(අ) වාර්තාකරණයේදී ළමයාගේ අභිමානය, පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම වැදගත් ලෙස සැලකිය යුතුය.

(ආ) වාර්තාකරණයේදී ළමයා අනන්‍යතාව හෝ නින්දාවට සහ පීඩාවට හේතු විය හැකි පුද්ගලික තත්ත්වයන් හෙළිදරව් කිරීමෙන් වැළකිය යුතුය.

(ඇ) ළමයා සම්බන්ධයෙන් තොරතුරු සකස් කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලියේදීම ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව තහවුරු වන බවට සහතික විය යුතුය.

(ඈ) ළමයාගේ ජාතිය, ආගම, වර්ගය, ලිංගිකත්ව ඇතුළු සියලුම ආකාරයේ විවිධත්වයන් නොසලකා හැර ළමයා, ළමයා සේ වාර්තා කළ යුතුය.

## 1.4 හානිය වළක්වා ගැනීම

(අ) වාර්තාකරණයේදී ළමයාට ශාරීරිකව, චිත්තවේගීයව, අධ්‍යාත්මික හෝ සමාජීය වශයෙන් සෘජුව හෝ වක්‍රව සෘණාත්මක බලපෑමක් නොවන බවට සහතික කළ යුතුය.

(ආ) ළමයා සම්බන්ධ සියලු වාර්තාකරණයන් අසත්‍ය තොරතුරු සහ වෛරී ප්‍රකාශ වලින් තොර විය යුතුය.

## 1.5 දැනුවත් ලිඛිත කැමැත්ත

(අ) ළමයා හා සම්බන්ධ කවර වාර්තාකරණයක් සඳහා වුව ළමයා සම්බන්ධ කර ගැනීමේදී ළමයාගේ දෙමාපියන්ගේ හෝ නිත්‍යානුකූල භාරකරුවන්ගේ ලිඛිත කැමැත්ත ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

(ආ) දැනුවත් ලිඛිත කැමැත්ත ලබා ගැනීමේදී අදාළ තොරතුරු මාධ්‍යයෙන් විකාශය වීමෙන් ඇති විය හැකි සෘජු සහ වක්‍ර බලපෑම් පිළිබඳව අදාළ පාර්ශවය දැනුවත් කිරීම සිදු කළ යුතුය. එසේ වුවත් වෘත්තීය සදාචාරාත්මක වගකීම සහ ආචාරධර්ම පිළිබඳව මාධ්‍යවේදීන්, මාධ්‍ය වෘත්තිකයන් සහ ඩිජිටල් වේදිකා සඳහා අන්තර්ගත සකසන්නන් සහ බලධාරීන් නැවත ස්වයං තක්සේරුවක නිරත වීමට වගබලා ගත යුතුය.

(ඇ) එසේ කැමැත්ත ලබා දුන් අවස්ථාවක වුවද, අවශ්‍ය වුවහොත් සිය තොරතුරු ඉවත් කර ගැනීමට ළමයා සම්බන්ධ පාර්ශවයට අවසර හිමි විය යුතුය.

## 02 - අපයෝජන සහ අපරාධ වාර්තාකරණය

(අ) වාර්තාකරණයේදී ළමයාගේ ගෞරවය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම අත්‍යවශයෙන්ම කළ යුතුය. වින්දිතයන්, සාක්ෂිකරුවන් හෝ චූදිතයන්ගේ නම, ඡායාරූප, ලිපිනය, පවුල, පාසල හෝ වෙනත් හඳුනාගැනීමේ තොරතුරු කිසිවක් හෙළි නොකිරීමට වග බලා ගත යුතුය.

(ආ) වින්දිතයන් කම්පනයට පත් කළ හැකි, භීතිය ඇති කළ හැකි, හෝ අසාධාරණ, අයුක්ති සහගත හෝ ඍණාත්මක ලෙස මහජන ආකල්ප කෙරෙහි බලපෑම් කළ හැකි පරිගණක ආශ්‍රිත රූප (Graphics), කෘත්‍රිම බුද්ධිය යොදා ගනිමින් සකසන ලද අන්තර්ගත හෝ අතිශයෝක්තියෙන් යුතු සංවේදී භාෂාව යොදා ගැනීමෙන් වැළකිය යුතුය.

(ඇ) නීතිය බලාත්මක කිරීමේ ක්‍රමවේදයේදී ළමා වරදකරුවන් සහ සැකකරුවන් ලෙස නම් කර ඇති ළමුන්, අපරාධකරුවන් ලෙස හුවා දැක්වීමෙන් වැළකිය යුතුය. ළමා වරදකරුවන් හඳුනා ගැනීමට හේතු විය හැකි අධිකරණ ක්‍රියාමාර්ග, පොලිස් වාර්තා, නීතිමය ලියකියවිලි හෝ ඕනෑම සන්නිවේදන මාර්ගයක් ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකිය යුතුය.

(ඈ) වාර්තාකරණයේදී ළමා වින්දිතයන්, සාක්ෂිකරුවන් හෝ චූදිතයන්ට හෝ ඔවුන්ගේ පවුල, පාසල සහ ළමයා හා සම්බන්ධ සියලු සමාජ සංස්ථා පසුකාලීනව හෝ තවදුරටත් හානියක්, වෙනස් කොට සැලකීමක් හෝ සමාජ අපකීර්තියක් ඇතිවීමේ අවදානමකට ලක් නොකළ යුතුය. අදාළ පාර්ශව නැවත නැවතත් කම්පනයට පත් නොකළ යුතුය.

(ඉ) අදාළ සිදුවීම පුනරුච්චාරණය කිරීමෙන් ප්‍රචණ්ඩත්වය සාමාන්‍යකරණය කිරීමට හෝ සමස්ත ප්‍රජාව අතර භීතිය, පීඩාව සහ ආවේග ඇති නොකළ යුතුය.

(ඊ) වාර්තාකරණයේදී දේශීය සහ ජාත්‍යන්තර ළමා ආරක්ෂණ නීති, අණපනත්, ජාත්‍යන්තර සම්මුති සහ ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ නීති අනුගමනය කළ යුතුය.

# 03 - ළමා සියදිවි නසාගැනීම්

(අ) වාර්තාකරණයේදී ළමයාගේ ගෞරවය, අනන්‍යතාව සහ පෞද්ගලිකත්වය සෑම විටම ආරක්ෂා කර ඇති බව සහතික කළ යුතුය. ළමයාගේ සහ පවුලේ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙමින්, පවුල, පාසල, ළමයා හා සම්බන්ධ සියලු සමාජ සංස්ථා සහ ප්‍රජාව නැවත නැවතත් කම්පනයට පත් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

(ආ) වාර්තාකරණයේදී ළමයාගේ සහ පවුලේ අයගේ ගෞරවය සහ අනන්‍යතාව ආරක්ෂා කිරීම අත්‍යවශයෙන්ම කළ යුතුය. මියගිය ළමයාගේ පෞද්ගලික තොරතුරු කිසිවක් හෙළි නොකළ යුතුය. පවුලේ ඡායාරූප, සමාජ මාධ්‍යයන්හි පළ වූ පෞද්ගලික තොරතුරු වැනි දෑ වාර්තා නොකළ යුතුය.

(ඇ) පවුලේ සමීපතමයන් අදාළ තොරතුරු බෙදා ගැනීමට එකඟ වන්නේ නම්, දැනුවත් කැමැත්ත ලබාගෙන ඇති බවත්, මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්වීමෙන් පසු ඇති විය හැකි බලපෑම පිළිබඳව ඔවුන් සම්පූර්ණයෙන් වටහාගෙන ඇති බවත් සහතික කර ගැනීමට වග බලා ගත යුතුය. එසේ වුවත් වෘත්තීය සදාචාරාත්මක වගකීම සහ ආචාරධර්ම පිළිබඳව මාධ්‍යවේදීන්, මාධ්‍ය වෘත්තිකයන් සහ ඩිජිටල් වේදිකා සඳහා අන්තර්ගත සකසන්නන් සහ බලධාරීන් නැවත ස්වයං තක්සේරුවක නිරත වීමට වගබලා ගත යුතුය.

(ඈ) ළමයා සියදිවි නසාගැනීමේ හේතුව, ක්‍රමය, ස්ථානය, සියදිවි නසාගැනීම පිළිබඳව වින්දිතයා තබන ලද සටහන් ආදි සිද්ධියට අදාළ සියලු කරුණු පිළිබඳව තොරතුරු හෙළිදරව් නොකළ යුතුය.

(ඉ) සිද්ධියට අදාළ ඡායාරූප, වීඩියෝ, සීසීටීවී දර්ශන හෝ වෙනත් සමාජ මාධ්‍ය අන්තර්ගත වාර්තාකරණය සඳහා භාවිත නොකළ යුතුය.

(ඊ) වාර්තා කිරීමේදී පූර්ව නිගමන, අර්ථ නිරූපණයෙන් හෝ අගතියට පත් පාර්ශවයට හානියක් ඇති නොවන භාෂාවක් භාවිත කිරීමට කටයුතු කළ යුතුය.

(උ) ළමා සියදිවි නසාගැනීමේ ප්‍රවෘත්තිය ප්‍රධාන පුවතක් ලෙස වාර්තා නොකිරීමට වාර්තාකරුවන් කටයුතු කළ යුතුය.

(ඌ) ළමා සියදිවි නසාගැනීමේ ප්‍රවෘත්ති වාර්තා කිරීමේදී නැවත නැවතත් වාර්තා කිරීමට කටයුතු නොකළ යුතුය. එසේ කිරීමට සිදු වුවහොත්, මුල් සිදුවීම නැවත වාර්තාකරණය හෝ උපුටා ගැනීම සිදු නොකළ යුතුය.

(ඍ) අදාළ සිදුවීම සාමාන්‍යකරණය කිරීමට කිසිසේත්ම කටයුතු නොකළ යුතුය.

(ඎ) වාර්තාකරණයේදී දැනුවත් කිරීම් සහ සියදිවි නසාගැනීම් වැළැක්වීම ප්‍රවර්ධනය කිරීමට වගබලා ගත යුතුය. උපකාරක දුරකථන, උපදේශන සේවා සහ ප්‍රජා ආධාරක ජාල පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම වඩාත් සුදුසුය.

# 04 - විවිධ වැඩසටහන් සඳහා ළමුන් යොදා ගැනීම

## 4.1 පුවත් වාර්තාකරණය සහ ප්‍රවෘත්ති විකාශන

(අ) ළමා අපයෝජන, ළමා අපරාධ, ළමා අපචාර හා සම්බන්ධ සිදුවීමකදී වින්දිතයන්, සාක්ෂිකරුවන් හෝ ළමා වැරදිකරුවන්ගේ අනන්‍යතාව හෙළි කිරීමෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටිය යුතුය.

(ආ) යුද්ධයෙන්, ස්වාභාවික විපත්වලින් හෝ මානුෂීය අර්බුදවලින් පීඩාවට පත් වූ ළමයින් පිළිබද වාර්තාකරණයේදී ළමයාගේ උපරිම යහපත ආරක්ෂා කරමින් සහ මහජන සුබ සිද්ධිය අරභයා පමණක් වාර්තා කිරීමට වග බලා ගත යුතුය.

(ඇ) ළමයාගේ චිත්තවේගීය හැඟීම් සංවේදී කිරීම උදෙසා, ළමයාට, පවුලට, පාසලට, ළමයා හා සම්බන්ධ සියලු සමාජ සංස්ථාවන්ට සහ ප්‍රජාවට චිත්තවේගීය හානියක් හෝ පීඩාවක් ඇති කළ හැකි පරිගණක ආශ්‍රිත රූප, කෘත්‍රිම බුද්ධිය යොදා ගනිමින් සිදු කරන ප්‍රතිනිර්මාණ භාවිත නොකළ යුතුය.

(ඈ) සෑම වාර්තාකරණයක්ම නිවැරදි, සමබර සහ සංවේදී බව සහතික කළ යුතු අතර, ළමයාට දොස් පැවරිය හැකි හෝ අපකීර්තියට පත් කළ හැකි භාෂාවක් භාවිත නොකළ යුතුය.

(ඉ) ළමයාගේ ආරක්ෂාවට හානි කළ හැකි ආකාරයෙන් ළමයාගේ අනන්‍යතාවට සමීප රූප කෘත්‍රිම බුද්ධිය යොදා ගනිමින් ප්‍රතිනිර්මාණය නොකළ යුතුය.

(ඊ) වාර්තා කිරීමේදී එහි දිගුකාලීන ප්‍රතිවිපාක සලකා බලා ළමයාගේ ගෞරවය, මානසික, කායික, සමාජීය සහ අධ්‍යාත්මික යහපැවැත්ම සහ ආරක්ෂාව අත්‍යවශ්‍ය ප්‍රමුඛතාවක් ලෙස සැලකිය යුතුය.

## 4.2 නාට්‍ය සහ විනෝදාස්වාද වැඩසටහන්

(අ) ළමයෙකු කිසියම් නාට්‍ය, චිත්‍රපට, කාටූන් හෝ විනෝදාස්වාද වැඩසටහනකට සහභාගී වීමට පෙර ලිඛිතව දෙමාපිය හෝ නිත්‍යානුකූල භාරකරුගේ කැමැත්ත ලබා ගත යුතුය. එසේ කැමැත්ත ලබා දුන් අවස්ථාවක වුවද, අවශ්‍ය වුවහොත් අදාළ වැඩසටහනෙන් ඉවත් කර ගැනීමට ළමයා සම්බන්ධ පාර්ශවයට අවසර හිමි විය යුතුය.

(ආ) අන්තර්ගත සැකසීමේ කාලසටහන් වයසට උචිත ආකාරයෙන් විය යුතු අතර ළමයාගේ අධ්‍යාපනයට, විවේකයට හෝ සමස්ත යහපැවැත්මට බාධා නොවිය යුතුය.

(ඇ) ළමයා අපහසුතාවට පත් කරන හෝ ඔවුන්ගේ උපරිම යහපතට පටහැනි අන්තර්ගතයකට සහභාගී වීමට ඔවුන්ට බලපෑම් කිරීම හෝ බල කිරීම නොකළ යුතුය.

(ඈ) අදාළ වැඩසටහන් නිෂ්පාදන ක්‍රියාවලියේදී ළමයාට ශාරීරික හෝ මානසික අපහසුතා ඇති නොවන ආකාරයෙන් කාලය සැලසුම් කිරීමට වගබලා ගත යුතුය.

(ඉ) අදාළ වැඩසටහන් සැලසුම් කිරීමේදී ළමයාගේ වයස, බුද්ධි මට්ටම, අවබෝධ කර ගැනීමට ඇති හැකියාව ඇතුළු ළමයාගේ අනන්‍ය වූ ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

(ඊ) වැඩසටහනක අන්තර්ගතය කිසිවිටෙකත් ළමා අපයෝජන, ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය භාවිතය හෝ ළමයින්ගේ ශාරීරික, මානසික, සමාජීය සහ අධ්‍යාත්මික යහපැවැත්මට හානිකර නොවිය යුතුය.

(උ) වැඩසටහනක අන්තර්ගතයෙන් ළමයාට සිදුවන ශාරීරික හෝ මානසික හිංසන සාමාන්‍යකරණයට හෝ සාධාරණීකරණයට ලක් නොකළ යුතුය.

(ඌ) ළමයා සම්බන්ධ හෝ ළමයා යොදාගෙන ප්‍රතිනිර්මාණය වන නාට්‍යමය ජවනිකා සහ ඒ සම්බන්ධයෙන් වන මාධ්‍ය ආවරණය සංවේදීව සහ සදාචාරාත්මකව හැසිරවීමට වගබලා ගත යුතුය.

(එ) වැඩසටහන්හි දේශපාලන, ආගමික, සංස්කෘතික හෝ මතභේදාත්මක න්‍යාය පත්‍ර ප්‍රවර්ධනය කිරීමට ළමයා යොදා නොගත යුතුය.

(ඒ) ළමුන් සම්බන්ධ අතීත වැඩසටහන් නැවත පළ කිරීමේදී ඒ පිළිබදව නිසි අනුමැතියක් අදාළ පාර්ශව වෙතින් දැනුවත් කැමැත්ත සහිතව ලබා ගත යුතුය.

(ඔ) ළමයාගේ අනාගත අභිවෘද්ධියට හානියක් විය හැකි අයුරින් නිරූපණය නොකිරීමට අදාළ වැඩසටහන හා සම්බන්ධ සියලුම පාර්ශව වගබලා ගත යුතුය.

## 4.3 යථාකාරී (Reality) වැඩසටහන් සහ විවිධ තරඟ වැඩසටහන්

(අ) ළමයා හා සම්බන්ධ යථාකාරී වැඩසටහන් සහ විවිධ තරඟ සඳහා සහභාගී වීම දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුවෙකුගේ ලිඛිත දැනුවත් කැමැත්ත ඇතිව විය යුතුය. එසේ කැමැත්ත ලබා දුන් අවස්ථාවක වුවද, අවශ්‍ය වුවහොත් අදාළ වැඩසටහනෙන් ඉවත් කර ගැනීමට ළමයා සම්බන්ධ පාර්ශවයට අවසර හිමි විය යුතුය.

(ආ) වැඩසටහනේ ස්වභාවය, තරඟ ආකෘතිය සහ සහභාගී වීමට පෙර, ඇතිවිය හැකි චිත්තවේගීය හෝ ශාරීරික අභියෝග පිළිබඳව ළමයින්ට, දෙමාපියන්ට සහ නීත්‍යානුකූල භාරකරුවෙකුට දැනුම් දිය යුතු අතර. එවැනි තත්ත්වයන් වළක්වාලීමට අදාළ වැඩසටහන් නිෂ්පාදක වගබලා ගත යුතුය.

(ඈ) ළමයාගේ වයසට උචිත වේලාවන්, ප්‍රමාණවත් විවේකයක් සහ අධ්‍යාපනික කටයුතු වලට අනුකූල වීම ඇතුළු ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව හා සම්බන්ධ නීති අණ පනත් චක්‍රලේඛන සහ රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

(ඇ) ළමයා සම්බන්ධ වන තරගයන්හිදී විනිශ්චයකරුවන්, අනුග්‍රාහකයින්, ප්‍රේක්ෂකයින් හෝ සෙසු තරඟකරුවන් විසින් ළමයා මහජන අවමානයට, අධික විවේචනයට හෝ යම් ආකාරයක මානසික හිරිහැර කිරීම් ඇති කරන ආකාරයෙන් කටයුතු නොකළ යුතුය.

(ඉ) විනිශ්චය සහ අදහස් දැක්වීමේදී නිර්මාණාත්මක විය යුතු අතර, වයසට ගැළපෙන සහ දිරිගන්වනසුළු විය යුතුය. ළමයාගේ ආත්ම අභිමානයට හානි කළ හැකි භාෂාව, නිරූපන හෝ ඉඟි භාවිත නොකළ යුතුය.

(ඊ) තරඟ ආකෘති ප්‍රේක්ෂක ශ්‍රේණිගත කිරීම් සඳහා පමණක් නිර්මාණය කර නොමැති බව වැඩසටහන් නිෂ්පාදකයින් විසින් සහතික කළ යුතුය. අදාළ වැඩසටහන් මගින් ළමයාගේ දැනුම, ආකල්ප සහ කුසලතා සංවර්ධනයට ප්‍රමුඛතාව ලබා දෙමින් ජයග්‍රහණ සඳහා දිරිගැන්වීම් කළ යුතුය.

(උ) තරඟකරුවන්ට අවශ්‍ය වන්නේ නම් මනෝවිද්‍යාත්මක සහාය හෝ ළමා උපදේශනය සඳහා පහසුකම් අදාළ ආයතනය විසින් සැපයිය යුතුය.

## 4.4 සාකච්ඡාමය සහ කතා වැඩසටහන්

(අ) අදාළ වැඩසටහන් සඳහා ළමයෙකු සහභාගි වීමේදී, ළමයාගේ සහ දෙමව්පියන්ගෙන් හෝ නීත්‍යානුකූල භාරකරුවෙකුගෙන් ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

(ආ) ළමයා ආක්‍රමණශීලී ප්‍රශ්න කිරීම්වලට, ගැටුම්කාරී සාකච්ඡාවලට, කම්පන සහගත අත්දැකීම් බෙදා ගැනීමට හෝ චිත්තවේගීය පීඩාකාරී තත්ත්වයන්ට නිරාවරණය නොකළ යුතුය.

(ඇ) ළමයා සාකච්ඡා සඳහා යොදා ගැනීමේදී, භාෂාව සහ අන්තර්ගතය වයසට ගැළපෙන පරිදි සකස් විය යුතු අතර වැඩිහිටි තේමාවන්ට හෝ පීඩාකාරී අන්තර්ගතයට නිරාවරණය නොකළ යුතුය.

(ඈ) වැඩිහිටියන් වෙනුවෙන් දේශපාලන, ආගමික, වාර්ගික, ලිංගික, සංස්කෘතික සහ සමාජීය වශයෙන් අගතිගාමී හෝ මතභේදාත්මක අදහස් ප්‍රකාශ කිරීමට ළමයා යොදා නොගත යුතුය.

(උ) ළමයාට ගෞරවයෙන් සලකන බවටත්, විචාරකයින් හෝ ප්‍රේක්ෂකයින් විසින් විවේචනයට, විනිශ්චයට හෝ උපහාසයට ලක් නොවන බවටත් වැඩසටහන් නිෂ්පාදක වග බලාගත යුතුය.

(ඌ) වැඩසටහන් ප්‍රවර්ධනය සහ නැරඹුම් වාර වැඩි කිරීම් සඳහා සම්පූර්ණ වැඩසටහනෙන් කෙටි වීඩියෝ සැකසීමේදී ළමයාගේ කථා අනවශ්‍ය ලෙස සංවේදී කිරීමෙන් හෝ අතිශයෝක්තියට ලක් කිරීමෙන් වැළකිය යුතුය.

(එ) ළමයා ඇතුළත් සාකච්ඡාවල ඡායාරූප, කෙටි වීඩියෝ හෝ පටිගත කිරීම් අන්තර්ජාලය හරහා බෙදා ගන්නේ නම්, සයිබර් හිරිහැර කිරීම් හෝ වෙනත් කවර ආකාරයේ හෝ අගතියකට පත්වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

(ඒ) තරඟ සඳහා සහභාගි වන ළමයින් සඳහා මූලික අවශ්‍යතා සකසා දීමට අදාළ ආයතනයෙන් කටයුතු කළ යුතුය.

(ඔ) ළමයා වැඩසටහන් සඳහා රැගෙන ඒම, රඳවා තබා ගැනීම, ආපසු යාම අතර කාල සීමාව නිරීක්ෂණය සහ අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ආයතනික වශයෙන් නිසි භාරකරුවෙකුගේ සමීප අධීක්ෂණය අනිවාර්යෙන් පැවතිය යුතුය.

## 4.5 වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණය

(අ) ළමයා යොදාගෙන සිදු කරන වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණයේදී ඔවුන්ගේ අයිතිවාසිකම් සහ උපරිම යහපතට ප්‍රමුඛත්වය ලබා දීමට වග බලා ගත යුතුය.

(ආ) වෙළඳ දැන්වීම්වල ළමයා ඉදිරිපත් කිරීමට පෙර දෙමාපියන්ගෙන් හෝ නීත්‍යානුකූල භාරකරුවන්ගෙන් ලිඛිත කැමැත්ත ලබා ගත යුතුය. ප්‍රචාරණයේ ස්වභාවය සහ එහි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කළ යුතුය.

(ඈ) ළමයින්ගේ ගෞරවය ආරක්ෂා වන ආකාරයෙන් කටයුතු කිරීමට වග බලා ගත යුතුය.

(ඇ) ප්‍රචාරණ හෝ ප්‍රවර්ධන අන්තර්ගත ළමයින්ගේ කායික, මානසික, සහ චිත්තවේගීය යහපැවැත්මට හානි නොකළ යුතුය.

(ඉ) වෙළඳ ප්‍රචාරකයින් විසින් ළමා ශ්‍රමය වැළැක්වීමේ නීතිවලට අනුකූල විය යුතුය.

(ඊ) වෙළඳ දැන්වීම්වල ළමයා අවදානමක් හෝ අනාරක්ෂිත බවක් ඇති කරන කවර ආකාරයේ හෝ තත්ත්වයකට නිරාවරණය නොකළ යුතුය.

(උ) ළමයා සම්බන්ධ වන දැන්වීම් මගින් අනුකරණය කිරීමට දිරිගැන්විය හැකි අවදානම් හැසිරීම් සාමාන්‍යකරණය කිරීම හෝ ආකර්ෂණීය කිරීම නොකළ යුතුය.

(ඌ) වෙළඳ දැන්වීම්හි අන්තර්ගතය මගින් ළමා හිංසනය හෝ ළමයාට එරෙහි ප්‍රචණ්ඩත්වය ඇති නොකළ යුතුය.

(එ) වෙළඳ දැන්වීම්හි අන්තර්ගතය ලිංගික හැඟීම් උද්දීපනය සඳහා වන නිරූපනය, ඉඟි හෝ භාෂාවක් භාවිත නොකළ යුතුය.

(ඒ) වෙළඳ දැන්වීමක් හා සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම්වලදී පැහැදිලි ආරක්ෂිත ක්‍රම, ආරක්ෂිත ආම්පන්න සහ අදාළ විශේෂඥතාවක් සහිත පුද්ගලයන්ගේ සහාය ලබා ගත යුතුය.

(ඔ) ළමයා සම්බන්ධ සියලුම වෙළඳ දැන්වීම් ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ නීති සහ සදාචාරාත්මක ප්‍රචාරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

## 4.6 ආබාධ සහිත ළමුන් පිළිබඳ වාර්තා කිරීම

(අ) ආබාධ සහිත ළමයා සමාජයේ වඩාත්ම අවදානමට සහ අවධානයට ලක්විය යුතු කණ්ඩායමක් වන බැවින්, ඔවුන් අභිමානයෙන්, නිරවද්‍යතාවයෙන් සහ සංවේදීතාවයෙන් නිරූපණය කළ යුතුය.

(ආ) වාර්තාකරණයේදී සෑම විටම ආබාධ සහිත ළමයාට ඔවුන්ගේ ආබාධවලින් ආමන්ත්‍රණය නොකළ යුතුය.

(ඇ) වාර්තාකරණයේදී දෙමව්පියන්ගේ, නිත්‍යානුකූල භාරකරුගේ හෝ වගකිවයුතු ආයතනයක ලිඛිත අවසරයකින් තොරව ළමයාගේ සෞඛ්‍ය තත්ත්වය හෝ පෞද්ගලික තොරතුරු හෙළි නොකළ යුතුය.

(ඈ) ආබාධ සහිත ළමයෙකුගේ ආබාධය කෙරෙහි අවධානය යොමු නොකර, ඔවුන්ගේ හැකියාවන්, ජයග්‍රහණ සහ දායකත්වයන් ඉස්මතු කරමින් ධනාත්මකව නිරූපණය කළ යුතුය.

(ඉ) ආබාධ සහිත ළමයා සෘණාත්මකව ඒකාකෘතිකරණය (Stereotype) නොකර, ඔවුන්ගේ ශක්තීන් සහ අයිතිවාසිකම් අවධාරණය කළ යුතුය.

(ඊ) මාධ්‍ය වාර්තාකරණයෙන් ආබාධ සහිත ළමයා සඳහා සමාජ බාධක නිර්මාණය කිරීම වළක්වා ගත යුතුය. ඒ වෙනුවට සමාජීය ප්‍රවේශ්‍යතාව (Social accessibility) සහ සමාන අවස්ථා ප්‍රවර්ධනය කළ යුතුය.

(උ) වාර්තාකරණයේදී යොදා ගනු ලබන කවර ආකාරයේ වුව රූප, වීඩියෝ හෝ ශ්‍රව්‍ය අන්තර්ගතයක් ළමයාගේ පෞද්ගලිකත්වය, කැමැත්ත සහ ගෞරවයට ගරු කරන බවට සහතික කළ යුතුය.

(ඌ) වාර්තාකරණයේදී ළමයාගේ සමාජීය, අධ්‍යාපනික සහ චිත්තවේගීය යහපැවැත්මට දිගුකාලීන බලපෑම සලකා බැලිය යුතු අතර, නොදැනුවත්ව හෝ හානියක් නොවන බව සහතික කළ යුතුය.

(එ) මාධ්‍යවේදීන්, මාධ්‍ය වෘත්තිකයන්, ඩිජිටල් වේදිකා සදහා අන්තර්ගත සකසන්නන් සහ බලපෑම්කරන්නන් විසින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සදහා වන නීති, අයිතිවාසිකම් සහ සදාචාරාත්මක වාර්තාකරණය පිළිබඳ පුහුණුව ලබා ගැනීම අවධාරණය කෙරේ.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

ChildLine Sri Lanka 1929